**ශීර්ෂය 160 - පරිසර අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 160 - පරිසර අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
| --- | --- | --- |
| 1.6.1. (අ) | පෞද්ගලික ඉඩම් වෙනුවෙන් දරන ලද වියදම අමාත්‍යාංශයේ ගිණුම් වල දැක්වීම නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. | 1.6.1. (අ) (i) |
| 1.6.1.(ආ) | ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට හා ඉඩමේ තක්සේරු අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. | 1.6.1. (අ) (ii) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **(i)** | අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම්වල ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම යටතේ මධ්‍යම කඳුකරයේ මහනුවර, බදුල්ල, නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි නිසරු කෘෂිකාර්මික ඉඩම් පුනරුත්ථාපනය කිරීම යන ව්‍යාපෘතියේ පිරිවැය වූ රු.3,791,283 ක මුදලක් | වාර්ෂික අය වැය ඇස්තමේන්තු සකස් කරන විට භාණ්ඩාගාරයෙන් ලබා දී තිබූ වැය ශීර්ෂ අංක අනුව මෙම ව්‍යාපෘතියේ වියදම වාර්තා කරන ලදී. මෙම ව්‍යාපෘතිය මේ වන විට අවසන් වී ඇති බැවින් භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබාගෙන සුදුසු පරිදි ඉදිරියේ දී කටයුතු කරනු ඇත. | මෙම වටිනාකම සත්‍ය වශයෙන් අමාත්‍යාංශය සතු ඉඩම් වටිනාකමක් නොවන බැවින් එම අගය නිවැරදිව ගිණුම් වල අනාවරණය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දක්වා තිබුණි. පෞද්ගලික ඉඩම් පුනරුත්ථාපනය සිදුකරනු ලබන මෙම ව්‍යාපෘතියට අදාල පිරිවැය අමාත්‍යාංශයේ ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම යටතේ දැක්වීම තුළ අමාත්‍යාංශය සතු වත්කම් අගය වැරදි ලෙස නිරූපණය වේ. මෙම ව්‍යාපෘතිය වැය විෂය අංක 2105 ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම යටතේ ක්‍රියාත්මක කිරීම තුළ සත්‍ය වශයෙන් අමාත්‍යාංශය සතු නොවන වත්කමක්**,** අමාත්‍යාංශය සතු වත්කමක් ලෙස නිරූපණය වන බව නිරික්ෂණය විය. මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂය වන විට අවසන් වී තිබුණ ද අදාල අගය වත්කම් වටිනාකමින් ඉවත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | | |
| **(ii)** | පරිසර අමාත්‍යාංශය පවත්වා ගෙන යනු ලබන සොබාදම් පියස ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු.261,000,000 ක් මූල්‍ය නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීමට හා ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය මෙම අමාත්‍යාංශය වෙත පවරා දීමට කටයුතු කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත 2017 වර්ෂයේ සිට මේ දක්වා කිහිපවරක්ම දන්වා යවා ඇත. | තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කල යුතු අතර ඉඩම නීත්‍යානුකූල ලෙස පවරාගැනීමට කටයුතු කළ යුතුය. |

## (ආ) අග්‍රිම ශේෂය

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | අමාත්‍යාංශයේ කළමනාකරණ සේවයේ නිලධාරියෙකු විසින් සිදු කර තිබූ වංචාවක් සම්බන්ධයෙන් අයවිය යුතුව තිබූ රු.260,361 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ලෙස පැවති අතර එම අගය 2022 වර්ෂයේ දී අග්‍රිම ගිණුමේ ආරම්භක ශේෂය ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපණය කර නොතිබුණි. එම අග්‍රිම ශේෂය මාසිකව අයකර ගැනීමට කටයුතු කර තිබුණු අතර භාණ්ඩාගාර මුද්‍රිත අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට රු. 130,180 ක මුදලක් තවදුරටත් අයවිය යුතුව පැවතුණ ද 2022 දෙසැම්බර් 31 වන විට අයවිය යුතුව තිබූ අගය නොපියවූ අග්‍රිම ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි. | පියවිය යුතුව තිබූ අග්‍රිමය වන රු.260,361.36 ක මුදලින් 2022 ජූලි මස සිට මැයි මස දක්වා රු.238,664.25 ක මුදල වාරික වශයෙන් ලැබී පියවා ඇත. ඉතිරි අග්‍රිම ශේෂය වන රු. 21,697.11 ක මුදල 2023 ජූනි මස පියවීමට නියමිතය. | ආරම්භක හා අවසාන ශේෂයන් මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |

## (ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(i) තොග පොත** | | |
| මුදල් රෙගුලාසි 751 හා 763 ප්‍රකාරව තොග පොත් පවත්වා නොතිබුණි. | ඇතැම් අවස්ථාවලදි තොග පොත් යාවත්කාලීන කිරීමේ යම් ප්‍රමාදයක් සිදුවී ඇති බව නිරීක්ෂණය කරන බැවින් ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීම සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කර ඇති අතර ඒ අනුව නිතිපතා ලේඛණ යාවත්කාලීන කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 751 හා 763 ප්‍රකාරව තොග පොත් පවත්වා ගත යුතුය |
| **(ii) ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඇප අයකළ යුතු තනතුරු දරන නිලධාරින්ට රාජකාරී පැවැරීම ද ඉතා අපහසු වී තිබිය දී එම නිලධාරීන්ගෙන්ම ඇප අයකර ගැනීම ප්‍රායෝගිකව ගැටළු සහගත වි ඇත. ඉදිරියේ දී මේ පිළිබඳ කටයුතු කරන විට ඇප ලේඛනය ද නඩත්තු කිරිමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 වර්ෂය සඳහා වැය විෂයන් 07 ක් වෙනුවෙන් ශුද්ධ ප්‍රතිපාදනය වූ රු. 5,400,000 ක මුදලක් සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | ප්‍රාග්ධන ස්වරූපයේ පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම් අවශ්‍යතාවයන් 2022 වර්ෂයේ ඇති නොවීම, 2022 වර්ෂයේ නිකුත් වූ වියදම් පාලන චක්‍රලේඛ හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කළ නොහැකි වීම, වර්ෂය අවසන් වන විටත් ඇණවුම් කල භාණ්ඩ ලැබී නොතිබූ බැවින් | වියදම කාලීනව සමාලෝචනය කල යුතු අතර නිසි පරිදි ඇස්තමේන්තු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ගෙවීම් කිරීම සඳහා අක්මුදල් ඉල්ලුම් නොකිරීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | |
| (ආ) | 2022 වර්ෂය සඳහා ව්‍යාපෘති 08 ක් වෙනුවෙන් ප්‍රතිපාදනය කරන ලද මුදල වූ රු.78,600,000 න් සියයට පනහකට වැඩි මුදල් ප්‍රමාණයක් වියදම් නොකොට ඉතිරි වී තිබුණු බව නිරීක්ෂණය විය. | අළුත්වැඩියා අවශ්‍යතාවයන් නොවීම, රාජ්‍ය භාෂා වැඩසටහන් පැවැත්වීම සඳහා සම්පත් දායකයින් සම්බන්ධ කර ගැනීම ප්‍රමාදවීම, ප්‍රතිපාදන වෙන් වී තිබූ ප්‍රමාණයට වඩා අවම ප්‍රමාණයක අවශ්‍යතා ඇති වීම , 2022 වර්ෂයේ නිකුත් වූ වියදම් පාලන චක්‍රලේඛ හේතුවෙන් නව මිලදී ගැනීම් හා පුහුණු වැඩසටහන් පැවැත්වීම අත්හිටුවීමට සිදු වීම, 2022 වර්ෂයේ නිකුත් කරන ලද වියදම් පාලන චක්‍රලේඛ හේතුවෙන් සියලු මිලදී ගැනීම් හා ගිවිසුම්වලට එළඹීම අත්හිටුවීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරිවිය. | වියදම නිවැරදිව ඇස්තමේන්තුකිරීම, කාලීනව සමාලෝචනය කිරීම හා අවශ්‍ය පරිදි සංශෝධන සිදු කල යුතුය. |
| (ඇ) | 2021 අංක 30 දරන විසර්ජන පනතේ 6(1) වගන්තියේ සඳහන් පරිපූරක සහාය සේවා සහ හදිසි අවස්ථා වගකීම් ව්‍යාපෘති මඟින් පරිසර අමාත්‍යාංශය සඳහා ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් ප්‍රතිපාදන වශයෙන් රු.5,175,000 ක් ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදනයෙන් රු. 1,078,805 ක මුදල් ප්‍රමාණයක් වියදම් නොකොට ඉතිරි වී ඇති බව නිරීක්ෂණය විය. | විදේශ සංචාරයන් සඳහා ගුවන් ටිකත්පත් වෙනුවෙන් ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා අඩු වියදමක් දැරීමට සිදුවීම, වෙළඳපොල තත්ත්වයන් හේතුවෙන් වර්ෂය අවසානයේ දී අමතර කොටස් සොයා ගැනීමේ අපහසුතා මත ඇතැම් වාහන අළුත්වැඩියාවන් සිදු කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ප්‍රමාණය ඉතිරී වී තිබුණි. | පනතේ විවිධාන අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමාත්‍යාංශයේ 2022 වර්ෂය තුළ දරා ඇති මූලධන ව්‍යාපෘති සඳහා වන වියදම පරීක්ෂාවේදී ව්‍යාපෘති 11 කට අදාලව මුළු වියදමින් සියයට 75 කට ආසන්න ප්‍රමාණයක් දරා ඇත්තේ අවසන් කාර්තුව තුළදී බව නිරීක්ෂණය විය. ඒ අනුව අවසන් කාර්තුව තුළ ප්‍රතිපාදන නිදහස් කිරීම මත එම ව්‍යාපෘති කාර්යයන් සිදු කිරීමේ දී අපේක්ෂිත කාර්යසාධන මට්ටමට ළඟා වීමේ අපහසුතා ඇතිවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය. | මෙම අමාත්‍යාංශයට මෙන්ම මෙම අමාත්‍යාංශය විසින් මු.රෙ.208 යටතේ ප්‍රතිපාදන නිදහස් කරන ලද අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට මුල් කාර්තුවල ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම ද අවසන් කාර්තුවේ වියදම වැඩිවීමට ප්‍රධාන හේතුවක් විය. | වියදම් සිදු කිරීම මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හැකි ලෙස මූලධන වියදම් සැලැසුමකට අනුව යෙදවීමට කටයුතු කල යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | | **රු.** | | | |
| (i) | **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | | | |
| | 1980 අංක 47 දරණ ජාතික පාරිසරික (සංශෝධිත) පනතේ 23 (අ) සහ (ආ) වගන්ති | - | අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ සහ එම පනත යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ප්‍රමිතිවලට හා වෙනත් උපමානවලට | පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාරව පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීමට 2022.10.17 දින අයදුම්පත්‍රයක් මධ්‍යම පරිසර අධිකාරියට යොමු කර ඇත. ඒ සඳහා රු. 7076.64 ක මුදලක් මේ වන විට ගෙවීම් කර ඇති අතර | පනතේ විවිධාන අනුගමනය කරමින් පූර්වාදර්ශයක් ලැබෙන ආකාරයට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | අනුකූලව හැර පරිසර දූෂණය සිදුවිය හැකි අපද්‍රව්‍ය පරිසරය වෙත බැහැර කිරීම සිදු නොකළ යුතු බවට දක්වා තිබුණද පරිසර අමාත්‍යාංශයේ අපජල පිරිපහදු පද්ධතිය භාවිතය ආරම්භ කල දින සිට විගණිත දිනය වූ 2023 මැයි 03 දින දක්වා (වර්ෂ 05කට අධික කාලයක්) පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා නොගෙන පවත්වාගෙන යාමට කටයුතු කර තිබූ බව නිරීක්ෂණය විය. | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කර ඇත. | |
| (ii) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | මුදල් රෙගුලාසි 104 (1) (4) | - | හානිය සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය සතු වාහන 02 ක් අනතුරට ලක් වී වර්ෂයකට අධික කාලයක් ගතවී තිබුණ ද 2023 අප්‍රේල් 21 දින වන විටත් ඒ | වෙළඳපොලේ අමතර කොටස් ලබා ගැනීමේ හිඟතාවය නිසා වාන 02කට අදාල අළුත්වැඩියා වියදමට ඇස්තමේන්තුවක් ලබා දීමට නොහැකි වී තිබේ. අමතර කොටස් හිඟවීම හේතුවෙන් වාහන අනතුරු 04 ට අදාල පූර්ණ වාර්තා ලබාදීම කල්ගත වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | අනුව කටයුතු කර නොතිබුණි. තවද වාහන අනතුරු 4 ක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවන් ලබා දීමේදී මාස 02 ත් 05 ත් අතර කාල ප්‍රමාද වීම් නිරීක්ෂණය විය. | | |
| (iii) | **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | | | |
| | 2017 දෙසැම්බර් 31 දිනැති අංක 2/2017 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | - | 2018 ජුනි 30 දිනට පෙර රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින් ලියාපදිංචි කළ යුතුව තිබුණද පරිසර අමාත්‍යාංශය භාවිතා කරන වාහන 04 ක් අමාත්‍යාංශය නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ජේදයේ සඳහන් වාහන පවරා ගැනීම සම්බන්ධයෙන් විවිධ ප්‍රායෝගික හේතු මත ප්‍රමාදයන් සිදුවී ඇති අතර ඇතැම් හේතු මෙම අමාත්‍යාංශයේ වගකීමෙන් බැහැර ව ඇති බව නිරීක්ෂණය කරමි. | නීත්‍යානුකූලව පවරාගැනීමට කටයුතු කිරීම හා පසුවිපරම් සිදු කිරීම. |
| (vii) | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | | | |
| | 2020 නොවැම්බර් 09 දිනැති අංක 04/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | අමාත්‍යාංශය විසින් ආරක්ෂක සේවා ප්‍රසම්පාදනය පෞද්ගලික අංශයට විවෘත කර නොතිබූ අතර ඒ මගින් | චක්‍රලේඛ ප්‍රකාරව උපරිම ආර්ථික වාසියක් ලැබෙන ආකාරයට කටයුතු කළ යුතුය. | රාජ්‍ය ව්‍යාපාර වෙතින් සේවාව ලබාගන්නේ නම් මූල්‍ය ඇගයීම් කිරීමේ දී 15 % ක විශේෂ ප්‍රමුඛතාවයක් ලබාදිය යුතු බවට සඳහන් කර ඇති |

| | | |
|---|---|---|
| | සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන සියලු පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථාවක් ලබා දී නොතිබූ බව නිරීක්ෂණය විය. | නමුත් රජයට අනුබද්ධිත ආයතනයක් වූ සී/ස එල්.ආර්.ඩී.සී සේවා (පුද්ගලික) සමාගමට ආරක්ෂක සේවා සැපයීමේ ප්‍රසම්පාදනය පිරිනමන ලද බැවින් එවැනි විශේෂ ප්‍රමුඛතාවයක් ලබාදීමේ අවශ්‍යතාවයක් තිබී නොමැත. |

**2.3 අවිධිමත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) අනුමත නොකළ ගෙවීම්**

විධිමත් අනුමැතියකින් තොරව පහත සඳහන් ගෙවීම් සිදු කර තිබුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| * ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශනය ප්‍රකාරව ලංසුව ප්‍රතිග්‍රහනය කිරීමෙන් පසු අදාල ආයතනය සමග කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කල යුතු වුවද අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේ ආරක්ෂක සේවා සැපයීම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරිම 2022 අගෝස්තු 17 දින සිදු කර තිබූ අතර 2022 ජනවාරි සිට 2022 අගෝස්තු 17 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා නෛතික ගිවිසුමක් රහිතව රු.5,383,470 ක් ගෙවා තිබුණු බව විගණනයේදී අනාවරණය විය. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී නියමිත මාර්ගෝපදේශ අනුගමනය කල යුතු අතර නීත්‍යානුකූල ගිවිසුම් වලින් බැහැරව රජයේ මුදල් වියදම් නොකල යුතුය. | එල්.ආර්.ඩී.සී සේවා (පුද්ගලික) සමාගම රජයට අනුබද්ධ සමාගමක් බැවින් ද, වසර කිහිපයක් අමාත්‍යාංශයේ ආරක්ෂක සේවාව සපයා තිබූ බැවින් ද, අමාත්‍යාංශය හා එම ආයතනය අතර අන්‍යොන්‍ය අවබෝධයකින් කටයුතු කළ බැවින් ද ඇතැම් අවස්ථාවල දී ලිඛිතව තොරතුරු හුවමාරුව සිදු වී නොමැත. තවද මෙම ආයතනය පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබූ බැවින් විශේෂයෙන් ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කිරීමක් සිදු වී නොමැත. එමෙන්ම විවිධ ප්‍රායෝගික හේතූන් මත ගිවිසුම අත්සන් කිරිම ප්‍රමාද වී තිබූ නමුත් එම ආයතනය සමඟ අවබෝධයෙන් කටයුතු කිරීම හේතුවෙන් කිසිදු බාධාවකින් තොරව එම ආයතනය ආරක්ෂක සේවාව අඛණ්ඩව ලබා දීම සිදු කරන ලදී. |

## 2.4 තැන්පත් ශේෂයන්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් සඳහා රැඳවුම් මුදල් සම්බන්ධ භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුම් අංක 6000-0-0-16-0-61 යටතේ 2015 සහ 2016 වර්ෂයේ සිට වර්ෂ 06කට වැඩි කාලයක් පවතින රු.30,737,540 ක තැන්පතු ශේෂයක් තැන්පතු කාල විශ්ලේෂණය තුළ අවුරුදු 2 ත් 5ත් අතර කාලසීමාවක් පවතින ශේෂයක් ලෙස සාවද්‍ය ලෙස දක්වා තිබුණි. තවද එම ශේෂය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570(ඇ) ප්‍රකාරව සහ මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ වන විට **CECB** ආයතනය විසින් ඉදිරිපත් කර ඇති සියළු බිල්පත් සඳහා ගෙවීම් සිදු කර ඇති අතර ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් අවසාන බිල්පත සහතික කර ගැනීමෙන් පසු කොන්ත්‍රාත් රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු අතර නිවැරදි හා සත්‍ය තොරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් නොවන සහ වාර්ෂික අයවැය මගින් මුදල් වෙන් නොකරන ලද පරිසර හිතකාමී කාබනික පොහොර සඳහා උත්තේජකයක් ලෙස ජෛව අඟුරු(**Bio Char**) භාවිතය පිළිබඳ කරනු ලැබූ | ශක්‍යතා අධ්‍යයනය වාර්තාව මගින් මෙම ව්‍යාපෘතිය ස්ථාපනය සුදුසු නොවන බව නිර්දේශ කරන ලද අතර දේශීය වශයෙන් කුඩා පරිමාණයේ ජෛව අඟුරු නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයින්ගේ ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර නිසි සැලැසුමකට හා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සහිතව ආරම්භ කල යුතු අතර වියදම මගින් අපේක්ෂිත අරමුණු ලඟා කර ගත හැකි ලෙස කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| ව්‍යාපෘතිය හදිසි කටයුත්තක් ලෙස සලකා අමාත්‍යාංශය විසින් විධිමත් මිලදී ගැනීමේ මාර්ගෝපදේශයන් සහ පටිපාටියන් අනුගමනය නොකරමින් විෂයභාර අමාත්‍යවරයා හරහා ව්‍යාපෘති යෝජනා ලබාගෙන එම ව්‍යාපෘති යෝජනාව ඇගයීම සඳහා රු.150,000 ක් වැය කර තිබුණ ද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම වැය නිෂ්කාර්ය වැයක් බව විගණනයේදී නිරීක්ෂණය විය. | සුදුසු බව නිර්දේශ කළ ද, ජෛව විවිධත්ව අංශය වෙත වෙන් කරන ලද වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින්, එම නිර්දේශය ක්‍රියාවට නැංවීමට නොහැකි විය. | |

## 3.2 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මඟින් පරිසර සංරක්ෂණය වැඩසටහන යටතේ පැලතවාන් ඇති කිරීම සඳහා යොමු කළ අමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳව මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අනුව ව්‍යවසායකයින් තෝරා ගැනීමේදී නිර්ණායක හා ඔවුන්ගේ ධාරිතාවය සලකා බැලිය යුතු වුවද එසේ නොකිරීම නිසා ව්‍යවසායකයින් 28 දෙනෙකු වැඩ සටහන අතර මඟ නවතා දමා තිබුණි. ඒ අනුව නොගැළපෙන හා ශක්‍යතාවයක් නොමැති | මෙම වැඩසටහන සඳහා හරිත ව්‍යවසායකයින් තෝරා ගැනීමේ දී අඩු ආදායම්ලාභී පවුල් ඒකකයක් ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් සහතික කරන ලද අයදුම්පත් තෝරාගන්නා ලදී. මෙම සියළු තෝරා ගැනීම් දිස්ත්‍රික් ලේකම්ගේ හා ප්‍රාදේශීය ලේකම් ගේ අනුමැතිය මත තෝරා එවන ලද අයගෙන් පමණක් තෝරාගත් අයවේ. තවද වැඩසටහන නවතා දැමීම නිර්ණායක ගැටළු නිසා නොව වෙනත් විවිධ හේතු ද බලපා ඇත. වාර්තාවේ සඳහන් ප්‍රතිලාභීන් 28 දෙනාගෙන් දෙදෙනෙකු ප්‍රතිලාභ මුදල් ලබාගෙන නොමැති අතර තවත් | අමාත්‍ය මණ්ඩල තීරණ හා අදාල නිරීක්ෂණ අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිලාභීන් තෝරා ගැනීම නිසා සත්‍ය වශයෙන් ප්‍රතිලාභ හිමි විය යුතු ව්‍යවසායකයින්ට අවස්ථාව අහිමි වී තිබුණු අතර රජයේ මුදල් නිෂ්කාර්යව වැය කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | 17 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල් අයකරගෙන ඇත. ඉතිරිය ද අය කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත දන්වා ඇත. | |
| (ආ) | මෙම වැඩ සටහන දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද ඇතැම් දිස්ත්‍රික්ක ඒ සඳහා සඳහා සම්බන්ධ නොවීම නිසා වැඩසටහන අපේක්ෂිත ආකාරයට ක්‍රියාත්මක වී නොතිබුණු අතර මෙම වැඩසටහන සඳහා සම්බන්ධ වූ ප්‍රතිලාභීන් 336 න් හම්බන්තොට දිස්ත්‍රික්කයේ සහභාගීත්වය සියයට 20 කට ආසන්න ප්‍රමාණයක් බව නිරීක්ෂණය විය. මේ අනුව වැඩි ප්‍රතිලාභීන් ප්‍රමාණයක් හම්බන්තොට දිස්ත්‍රික්කය තුළින් තෝරා ගැනීමේ පදනම හා හේතු විගණනය වෙත ඉදිරිපත් නොවීය. | ඇතැම් දිස්ත්‍රික්ක වලින් අවමය ඉක්මවා අයදුම්පත් ප්‍රමාණයක් ලැබුණු අතර ඒ අනුව ලැබුණු අයදුම්පත් සියල්ල ඇගයීම් කර ප්‍රතිලාභීන් තෝරාගත් අතර එය උපරිම සීමාව වන පැළ තවාන් 650 නොඉක්මවන ලදි. කෙසේ වෙතත් මෙම හරිත ව්‍යවසායකත්ව වැඩසටහන සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් විසින් වැඩි ඉල්ලුම්පත් ප්‍රමාණයක් යොමු කර තිබුනු අතර ඇගයීමේදී එම දිස්ත්‍රික්කයෙන් වැඩි ඉල්ලුම්පත් ප්‍රමාණයක් සුදුසුකම් සපුරා තිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණ හා අදාල නිරීක්ෂණ අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | වැඩසටහනට අදාලව අමාත්‍යාංශය විසින් 2022 මාර්තු සිට 2022 දෙසැම්බර් දක්වා සිදු කරනු ලැබූ පුහුණු වැඩසටහන් සඳහා රු.2,499,450 ක් වැය කර තිබූ අතර ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා ප්‍රතිලාභීන්ට ලබා දිය යුතු තාක්ෂණික හා අනෙකුත් | හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මඟින් පරිසර සංරක්ෂණ ව්‍යාපෘතිය සඳහා තෝරාගන්නා ලද ප්‍රතිලාභීන් පුහුණු කිරීමේදී ව්‍යාපෘතිය අතරතුර පුහුණුවක් ලබා දීමට කටයුතු කර ඇත. ව්‍යාපෘතිය ආරම්භ කිරීමකින් තොරව අදාල පුහුණු ලබාදීමේදී පුහුණුව සඳහා යොමු නොවීමේ ඉඩකඩක් පවතින | පුහුණු වැඩසටහන් මඟින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගත හැකි ලෙස හම වැඩසටහන් සංවිධානය කල යුතු අතර අමාත්‍යමණ්ඩල තීරණ හා නිරීක්ෂණයන් අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පුහුණුවීම් ප්‍රතිලාභීන් විසින් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමට පෙර ලබා දී නොතිබුණි. ඒ අනුව පුහුණු වැඩසටහන් සඳහා වැය කර ඇති මුදල මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම අවම මට්ටමක පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය. | බැවින් පුහුණුව වැඩසටහන අතරතුර ලබාදෙන ලදී. | |
| (ඇ) | මෙම ව්‍යාපෘතියේ මූලික නිර්ණායකයක් ලෙස අඩු ආදායම්ලාභීන් ඉලක්ක කරගත යුතු වුවද අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඩු ආදායම්ලාභීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුට මෙම ව්‍යාපෘතිය සඳහා රු. 600,000 ක මුදලක් ලබා දී තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ප්‍රතිලාභින් තෝරා ගැනීමේදී තෝරාගැනීමේ නිර්ණායකයන්ට අනුව අඩු ආදායම්ලාභිත්වය නිර්ණායකයක් වන අතර ආදායම් තත්වයන් පරික්ෂා කිරිමේදී ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත අයදුම්කරුවන් තෝරා ගන්නා ලද අතර අම්බලන්තොට ප්‍රදේශයටද මේ ක්‍රියාදාමයට අනුගමනය කරන ලදී. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාල නිර්ණායක පිළියෙල කර ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | මෙම වැඩසටහන සඳහා රු.150,000 බැගින් පලමු අදියර ක්‍රියාත්මක කිරීමට මුදල් ලබාගත් ප්‍රතිලාභීන් 28 දෙනෙකු එය අතර මඟ නවතා ඇති අතර ඉන් 09 දෙනෙකුගෙන් අමාත්‍යාංශයට අය විය යුතු රු.1,411,581ක මුදලක් අය වී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. එසේම ඉහත ප්‍රතිලාභීන්ගේ දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.296,500 ක් නැවත ගෙවූ බවට තහවුරු කිරීමක් විගණනය වෙත ඉදිරිපත් නොවීය. තවද ඉහත ප්‍රතිලාභීන් සඳහා වාරික ලබා දීමේදී පරිපාලන වියදම් ලෙස රු.85,231 | ප්‍රතිලාභින් 28 දෙනාගෙන් 17 දෙනෙකුගෙන් ලැබිය යුතු මුදල මේ වන විට අයකර ගෙන ඇත. තවත් ප්‍රතිලාභින් දෙදෙනෙකු සඳහා ප්‍රතිපාදන නිදහස් කළ ද ඔවුන් විසින් අදාළ මුදල ලබා ගෙන නොමැත. ඉතිරි ප්‍රතිලාභින් 09 දෙනාගෙන් අදාළ මුදල් ලබා ගැනීමට ද කටයුතු කරමින් පවතී. ඒ අනුව මේ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කරන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන්ට ලිඛිතව දන්වා ඇත. | ව්‍යාපෘති මඟින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හැකි ආකාරයට රජයේ මුදල් වැය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘති අරමුදල් මඟින් දරා ඇති අතර එය නිෂ්කාර්ය වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය. | | |
| (ඊ) | භෞතික විගණන අවස්ථාව වන විට පැලතවාන් දෙකක් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර මෙම වැඩසටහන යටතේ නිෂ්පාදනය කරනු ලබන පැල අලෙවි කර ගැනීම සඳහා අවශ්‍ය විධිමත් වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු බව ද නිරීක්ෂණය විය. ඒ අනුව මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක පැල තවාන් අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයක් පවතින බව තවදුරටත් නිරීක්ෂණය විය. | ව්‍යවසායකයන් ලෙස කටයුතු කිරීමට පසුගිය කාලයේ ඇති වූ ආර්ථික උපනතීන් අනුව මෙවැනි ව්‍යවසායන් පවත්වාගෙන යෑමේ අපහසුතාවයන් ඇති වී තිබෙන බවට එකඟ වන අතර රටේ ආර්ථික තත්ත්වය යහපත් වීමෙන් පසු සාමාන්‍ය පරිදි පැළ තවාන් කටයුතු සිදුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රතිලාභීන් ප්‍රාදේශීය මට්ටමින් තෝරාගත් අතර ඔවුන් ප්‍රාදේශීය පවතින වෙළඳපොළ පිළිබඳ අවබෝධයක් සහිතව ව්‍යාපෘතියට ඇතුළත් වී ඇත. | ව්‍යාපෘති අධීක්ෂණය, සමාලෝචනය නිසි පරිදි සිදු කල යුතුය. |
| (උ) | අමාත්‍යාංශයේ අනුමත කාර්යමණ්ඩලය තුළ ඇතුළත් ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ තනතුරු 05 වර්ෂ දෙකක සිට පුරප්පාඩු වී පැවතීම මඟින් මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ලබා ගත හැකිව තිබූ දැනුම ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබීම ද මෙවැනි ව්‍යාපෘතිවල කාර්යසාධන මට්ටම අඩු වීමට හේතුවිය හැකි බව තවදුරටත් නිරීක්ෂණය විය | පරිසර අමාත්‍යාංශය සෘජුව කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් සිදු නොකරන බැවින් මෙම තනතුරුවල අවශ්‍යතාවය පැන නොනගින නිසා තනතුරු ඇති කිරීම සඳහා වූ අනුමැතිය සංශෝධනය කර දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ලිඛිතව දැනුම් දී ඇත. පුහුණු වැඩසටහන් පවත්වන අවස්ථාවලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ මැදිහත් වීමෙන් එම දෙපාර්තමේන්තුවේ ආයතන තුළම අදාල ව්‍යවසායකයන් සඳහා පුහුණුව ලබා දෙන ලදී. | කාර්යමණ්ඩල සඳහා අනුමැතිය ලබාගැනීමට පෙර අමාත්‍යාංශ කාර්යභාරය පිළිබඳ සමාලෝචනයක් හා ඇගයීමක් සිදු කල යුතුය. |

## 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1. මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වයක් විසින් ලංසුව ප්‍රතිග්‍රහණය කිරිමෙන් පසුව අදාල ආයතනය වෙත විධිමත් ප්‍රතිග්‍රහන ලිපියක් නිකුත් කල යුතු වුවද අමාත්‍යාංශය විසින් ආරක්ෂක සේවා කටයුතු සැලසීමට අදාල ආයතනය වෙත නිකුත් කරන ලද ප්‍රතිග්‍රහන ලිපියක් විගණනයට ඉදිරිපත් නොවීය. | එල්.ආර්.ඩී.සී සේවා (පුද්ගලික) සමාගම රජයට අනුබද්ධ සමාගමක් බැවින් ද, වසර කිහිපයක් අමාත්‍යාංශයේ ආරක්ෂක සේවාව සපයා තිබූ බැවින් ද, අමාත්‍යාංශය හා එම ආයතනය අතර අන්‍යොන්‍ය අවබෝධයකින් කටයුතු කළ බැවින් ද ඇතැම් අවස්ථාවල දී ලිඛිතව තොරතුරු හුවමාරුව සිදු වී නොමැත. තවද මෙම ආයතනය පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබූ බැවින් විශේෂයෙන් ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් නොකළ ද එම ආයතනය සමඟ අවබෝධයෙන් කටයුතු කිරීම හේතුවෙන් කිසිදු බාධාවකින් තොරව එම ආයතනය ආරක්ෂක සේවාව අඛණ්ඩව ලබා දීම සිදු කරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019, 2020,2021 සහ 2022 වර්ෂවල සිදුකරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගෙන තිබූ අයිතම 02 ක් දිගින් දිගටම ඌණ අයිතමයන් ලෙස වාර්තා කර තිබුණු අතර 2023 මාර්තු 31 දින වන තෙක් මෙය නිවැරදි කරගැනීමට කටයුතුකර නොතිබුණි. | මේ පිළිබඳව සොයා බැලීමට කමිටුවක් පත්කර නිර්දේශ ලබාගෙන ඒ් පිළිබඳව ඉදිරියේ දී සුදුසු පරිදි කටයුතු කරනු ඇත. | වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා අනුව සිදු කරන නිර්දේශ ක්‍රියාත්මක කල යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අමාත්‍යාංශයේ ඇතැම් අංශ විසින් නඩත්තු කළ යුතු භාණ්ඩ වට්ටෝරු පොත් භාණ්ඩ සමීක්ෂණය සිදුකරන ලද අවස්ථාව වන විටත් යාවත්කාලීන කර නොතිබුණු බව අනාවරණය විය. | අංශවල බඩු වට්ටෝරු පොත් යාවත්කාලීන කිරීමට එම අංශවල නිලධාරීන්ට ප්‍රමාණාත්මක දැනුමක් නොමැති අවස්ථාවල යාවත්කාලීන කිරීමේ ප්‍රමාදයන් සිදු වී ඇති නමුත් ගබඩා සමීක්ෂණය සිදුකරන විට ගබඩා සමීක්ෂණ මණ්ඩලයේ සහ ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන්ගේ සහයෝගය ඇතුව අදාල බඩු වට්ටෝරු පොත් යාවත් කාලීන කර ඇත. | භාණ්ඩ වට්ටෝරු පොත් යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) | අමාත්‍යාංශයේ දේශගුණ විපර්යාස අංශයේ පැවති ව්‍යාපෘතියක් මඟින් 2022 වර්ෂයේදී අයිතමයන් 05 ක් දේශගුණ විපර්යාස අංශය වෙත ලබා දී තිබුණ ද ඒ සම්බන්ධයෙන් ගිණුම් අංශය දැනුවත් නොකිරීම නිසා එම අයිතම ප්‍රධාන වට්ටෝරු ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. ඒ | මෙම අයිතම 2022 වර්ෂයේ මෙම අමාත්‍යාංශයට ලැබී තිබුණු අතර 2022 වර්ෂයේ වාර්ෂික ගබඩා සමීක්ෂණයෙන් එම අයිතම පිළිබඳ සඳහන් කිරීමෙන් අනතුරුව මෙ වන විට වට්ටෝරු පොත් වලට ඇතුලත් කර ඇති අතර මූල්‍ය වටිනාකම අදාල ව්‍යාපෘති වලින් ගෙන්වාගෙන එම වටිනාකම්ද මූල්‍ය නොවන | භාණ්ඩ වට්ටෝරු පොත් කාලීනව අධීක්ෂණය හා සමාලෝචනය සුදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුව 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් අගය අඩුවෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය. | | වත්කම් වලට ඇතුලත් කර ගැනීමට කඩිනමින් ඇතුලත් කෙරෙනු ඇත. |
| (ඇ) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ 07 ක් අතිරික්ත භාණ්ඩ ලෙස හදුනාගෙන තිබුණ අතර එම භාණ්ඩ ප්‍රධාන වට්ටෝරු භාණ්ඩ ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. එම භාණ්ඩ අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් මූල්‍ය නොවන වත්කම් අගයෙන් නිරූපණය නොවන බැවින් අමාත්‍යාංශය සතු වත්කම් අගය අඩුවෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය. | මෙම ඡේදයේ සඳහන් අයිතම බඩු වට්ටෝරු පොතට මේ වන විට ඇතුලත් කර ඇති අතර මූල්‍ය වටිනාකම සොයා ගැනීමෙන් අනතුරුව කඩිනමින් මූල්‍ය නොවන වත්කම් වලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ඇත. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව සිදු කරන නිර්දේශ ක්‍රියාත්මක කල යුතුය. |
| (ඉ) | අමාත්‍යාංශයේ ලේඛනාගාරය **(Record Room)** තුළ භාවිතයට ගෙන නොමැති නව පරිගණක මේස 03 ක් කළමනාකරණ සහකාර මේස 02 ක් සහ මල් බඳුන් බහාලීම සඳහා යොදා ගැනීමට සකස් කර ඇති දැවමය බහාලුම් 8 ක් නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය වූ අතර 09 වන මහලේ විවෘත පරිශ්‍රයේ ඡායාපිටපත් යන්ත්‍ර තැබීමට සකසා ඇති ලී රාක්ක 03 ක් ද නිෂ්කාර්යව පැවති බව තව දුරටත් නිරීක්ෂණය විය. | මෙම ඡේදයේ සඳහන් අයිතම එවකට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ලෙස අමාත්‍යාංශය ක්‍රියාත්මක වන සමය තුල මිලදී ගෙන ඇති අයිතම වන අතර එවකට ප්‍රයෝජනයට ගෙන ඇත. එම අයිතම ගබඩාවේ තබා ගැනීමටද ප්‍රමාණවත් ඉඩ කඩ නොමැති බැවින් 9වන මහළේ ඒවාට හානි නොවන ලෙස මේ වන විට තබා ඇත. ඉදිරියේදී ඕනෑම අවස්ථාවකදී මේවා භාවිතයට ගැනීමේ හැකියාවක් ඇත. | රජයේ වත්කම් ඵලදායී හා කාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | අමාත්‍යාංශයේ වාහන සඳහා නව ටයර් මිලදී ගැනීමේදී ඉවත් කරනු ලබන පැරණි ටයර් ගබඩාව වෙත ලබා ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. 2022 වර්ෂයේදී නව ටයර් 74 ක් වාහන සඳහා යොදා තිබුණද ඊට අදාලව ඉවත් කරන ලද ටයර් අමාත්‍යාංශ පරිශ්‍රයේ ගබඩාකර නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර එම ටයර් අමාත්‍යාංශය වෙත ලබාගෙන අවශ්‍ය පරිදි වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයේ පැරණි ටයර් ගබඩා කිරීම සඳහා සුදුසු ගබඩා පරිශ්‍රයක් නොතිබූ බැවින් වාහන වලින් ඉවත් කරන පැරණි ටයර් නැවත අමාත්‍යාංශයට ලබාගෙන නොමැත. කෙසේ වුවත් ඉදිරියේදී මෙ සඳහා සුදුසු ගබඩා පරිශ්‍රයක් සකස් කරගෙන යෝජිතක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. | වාහන නඩත්තු සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතීන් ක්‍රියාත්මක කල යුතුය. |
| (උ) | පරිසර අමාත්‍යාංශය සතු සංචිත වාහන වලින් අළුත්වැඩියා කළ යුතු වාහන 06 ක් ගරාජ්වල සහ අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල් කර ඇති අතර මෙම වාහන වර්ෂ 01 ත් 10 ත් අතර කාලපරාසයක් ඒලෙස ගාල් කර පැවතියදී ද අලුත්වැඩියා කර නොතිබුණි. තවද එම වාහන වාහන 02 ක් වර්ෂ 05 ත් වර්ෂ 10 ත් අතර කාලයක් පෞද්ගලික පාර්ශවයන් සහ ගරාජ සන්තකයේ රඳවා ඇති බව නිරීක්ෂණය විය. | ප්‍රතිපාදන හිඟතාවය මත අලුත්වැඩියා කටයුතු ප්‍රමාද වීම, අපහරණය කිරීම සඳහා තක්සේරු වාර්තා ලබා ගත යුතුව ඇති වාහනයක් බැවින් රජයේ ආයතන වෙත ලබාදීමට සැලසුම් කර තිබීම, අත්තිකාරම් මුදලක් ලබා දිමෙන් අනතුරුව අලුත්වැඩියාව ආරම්භ කරන බව දන්වා තිබුණ ද මුදල් රෙගුලාසි අනුව එසේ අත්තිකාරම් ලබා දිම සඳහා විධිවිධාන නොමැති බැවින් අලුත්වැඩියාව ප්‍රමාද වීම, සහ වාහන අපහරණය කිරීම සඳහා අපහරණ කමිටුවක් පත්කර ගැනීම සඳහා කටයුතු කර තිබීම. | වාහන නඩත්තු සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතීන් ක්‍රියාත්මක කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඖ) | 2022 ජනවාරි 25 දිනැති අංක 04/2022 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුව 2020 අගෝස්තු 31 දින වන විට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කරන ලද ධාවන තත්වයේ නොපවතින අලුත් වැඩියා කිරීම ඵලදායි නොවන වාහන අපහරණය සිදුකර නොමැති නම් වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ අංක 05/2020 හි 02 (අ) මගින් ලබා දී ඇති උපදෙස් පරිදි එවැනි වාහන අපහරණය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට වහාම කටයුතු කළ යුතු වුවත් වාහන 02 ක් සම්බන්ධයෙන් ඉහත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පසුගිය වර්ෂවල අපහරණ කලයුතු වාහන හදුනා ගැනීමේ සමීක්ෂණ මණ්ඩලයක් විසින් අංක 65- 1578 සහ **HQ - 4331** දරන වාහන හඳුනාගෙන රාජ්‍ය ආයතනයන් වෙත ලබා දීමට උත්සාහ ගත්ත ද එසේ කිරීමට නොහැකි වී ඇත. මෙම වර්ෂයේ පත්කිරීමට නියමිත අපහරණ මණ්ඩලයේ අවධානය මේ සඳහා යොමු කිරීමට නියමිතව ඇත. | චක්‍රෙල්ක ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (එ) | සොබාදම් පියස ගොඩනැඟිලි පරිශ්‍රයේ රු.3,479,520 ක් වැය කර අපජල පිරිපහදු පද්ධතියක් ස්ථාපිත කර ඇති අතර එමගින් ජීව වායු නිෂ්පාදනය කර භාවිතා කිරීමට අපේක්ෂා කර තිබුණ ද 2017 සැප්තැම්බර් 14 දින සිට විගණිත දිනය වූ 2023 මාර්තු 23 දින දක්වා වූ වර්ෂ 5 කට අධික කාලයක් තුළ ජනනය වූ ජීව වායුව උපයෝජනය නොකර වායු ගෝලයට මුදා හැර තිබුණි. ඒ අනුව රු. 3,479,520 ක මුළු පිරිවැයක් දරා ජීව වායුව නිෂ්පාදනය කර උකහා ගත | ජීව වායු ඒකකයේ සිට ආපනශාලාව තෙක් ජීව වායුව රැගෙන ගොස් පරිහරණය කිරීම සඳහා ඊට අවශ්‍ය උපාංග යොදා සකස්කරන ලෙස අතිරේක ලේකම් (පාලන)ගේ 02/03/සේවා/01/23 හා 2019.10.08 දිනැති ලිපිය මගින් දන්වා ඇති අතර ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු පිළිබඳව මෙම අමාත්‍යාංශයේ නිලධාරීන් හා **CECB** ආයතනයේ නියෝජිතයින් අතර 2023.05.17 දින පැවති සාකච්ඡාවකදී මෙම අළුත්වැඩියාව සිදු කිරීම සම්බන්ධව එකඟතාව ප්‍රකාශ කර ඇත. | සම්පත් ඵලදායී ලෙස උපයෝජනය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හැකි පරිදි සකස් කර ඇති මෙම අපජල පිරිපහදු පද්ධතියෙන් එකී අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (ඒ) | 2021 අප්‍රේල් 21 දින නිකුත් කර තිබූ ප්‍රසම්පාදන කාර්යසංග්‍රහයේ 38 වන අතිරේකය අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 9.3.1 (අ) ප්‍රකාරව වාහන අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා වන මිල කැඳවීම් ආර්ථික වශයෙන් ඵලදායී ද යන්න සලකා බලා අදාල වාහන වල දේශීය නියෝජිතායතන වෙතින් සිදු කර ගත හැකි බව දක්වා තිබුණි. 2022 වර්ෂයේදී වාහන සේවා කිරීම් වලට අදාලව වාහන ඒජන්තවරුන් හරහා වාහන සේවා කිරීම සඳහා වාහන 36 කට අදාලව සේවා වාර 63 ක් සඳහා රු. 4,491,326 ක මුළු පිරිවැයක් දරා තිබුණ අතර මෙහිදී අදාල සේවා කිරීම් සඳහා දැරූ පිරිවැය ආර්ථික වශයෙන් ඵලදායීද යන්න විගණනයේදී තහවුරු නොවීය. | අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි අදාල වාහනවල දේශීය නියෝජිත ආයතන වෙතින් සිදු කර ගත හැකි වේ. ඒජන්තවරුන් හරහා වාහන සේවා කිරීම මෙතෙක් පැවති ක්‍රියාමාර්ගයයි. නමුත් මෙම ක්‍රියාමාර්ගය මඟින් වාහන සේවා කිරීමේ දී සාපේක්ෂව වැඩි වියදමක් දැරීමට සිදුවන හෙයින් ලියාපදිංචි ගරාජ් වලින් ද මිළ ගණන් කැඳවා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත සේවා සිදු කර ගැනීමට කටයුතු කරමින් පවතී. | ප්‍රසම්පාදන කාර්යසංග්‍රහය හා මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඔ) | අමාත්‍යාංශය තුළ ඒකාබද්ධ අරමුදලින්, විදේශ ප්‍රදාන මඟින් හෝ වෙනත් ආයතන මඟින් මුද්‍රණය කර තිබුණු පොත්, සඟරා, පෝස්ටර්, අත්පත්‍රිකා වැනි ප්‍රකාශන 34,889 කට | මෙම ඡේදයේ සඳහන් පොත්පත් සහ විවිධ ප්‍රකාශන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති යටතේ මුද්‍රණය කර ඇත. මෙම වැඩසටහන් දීර්ඝ කාලීනව | ව්‍යාපෘති සඳහා ලැබෙන ඒකාබද්ධ අරමුදල් සහ විදේශ ප්‍රදාන අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා වඩා කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතා කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආසන්න ප්‍රමාණයක් ප්‍රයෝජනයට නොගෙන එක් එක් අංශ තුළ හා ලේඛනාගාරය තුළ ගබඩා කර පැවති බව නිරීක්ෂණය වූ අතර එම මුද්‍රණ අතුරින් පිරිවැය හඳුනාගත හැකි වූ ප්‍රකාශන 23,977 ක පිරිවැය රු. 4,470,861 ක් විය. | ක්‍රියාත්මක වන වැඩසටහන් වන අතර වසර කිහිපයක ප්‍රයෝජනය සඳහා මෙම මුද්‍රණයන් සිදුකර ඇත. එමෙන්ම මෙම කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක **PSE/D/ME/**01/2023/**AQ/**09 හා 2023.04.25 දිනැති විගණන විමසුම සඳහා ඉදිරියේ දී විස්තරාත්මක පිළිතුරක් ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. | |
| (ඕ) | සුරකිමු ගංගා වැඩසටහන සඳහා ලබා ගෙන තිබූ පිරිවැය රු. 72,220 ක් වූ තණකොළ කපන යන්ත්‍ර 4 න් 3 ක් අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්යාලය තුළ නිෂ්කාර්යව තිබුණු බව නිරීක්ෂණය වූ අතර අනෙක් යන්ත්‍රය අමාත්‍යාංශ පරිශ්‍රයේ භාවිතා කරන බව අනාවරණය විය. මේ අනුව සුරකිමු ගංගා වැඩසටහන යටතේ වියදම් දරා මිලදී ගෙන තිබූ මෙම තණකොළ යන්ත්‍ර 04 අදාල වැඩසටහනෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | එවකට ගරු අමාත්‍යතුමා විසින් කරන ලද දැනුම්දීමකට අනුව සුරකිමු ගංගා වැඩසටහන යටතේ ගොවි සංවිධාන වලට බෙදා හැරීම සඳහා මෙම තණකොළ කපන යන්ත්‍ර වෙන්කර ඇත. එයින් එක් තණකොළ කපන යන්ත්‍රයක් අමාත්‍යාංශ පරිශ්‍රයට මායිම්ව ඇති ඇල මාර්ග පවිත්‍ර කිරීම සඳහා යොදාගනු ලබන අතර ඉතිරි යන්ත්‍ර අමාත්‍ය කාර්යාලයේ තබා ඇති අතර සුරකිමු ගංගා ව්‍යාපෘතිය යටතේ අවශ්‍ය ස්ථානයක් සඳහා ලබා දීමට අවශ්‍ය කටයුතු කරනු ඇත. | රජයේ අරමුදල් භාවිතා කරමින් මිලදී ගත් සම්පත් අපේක්ෂිත කාර්යයන් සඳහා යෙදවිය යුතුය. |
| (ත) | අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති වාහන 16 ක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබා දී එම අධිකාරිය තුළ භාවිතා වුවද එම වාහන නීත්‍යානුකූලව පවරා දී නොතිබුණි. තවද අමාත්‍යාංශයේ තොරතුරු අනුව වාහන 03 ක් මධ්‍යම පරිසර අධිකාරියට ලබා දී ඇති බව සඳහන් කර තිබුණ ද එම වාහන මධ්‍යම පරිසර | මෙම අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති මධ්‍යම පරිසර අධිකාරිය වෙත තාවකාලිකව අනුයුක්ත කර ඇති වාහන නීත්‍යානුකූලව පවරා දීමට තීරණය කර ඇති බැවින් එම වාහන පවරා ගැනීම සඳහා කඩිනමින් පියවර ගන්නා ලෙස දන්වා අතිරේක ලේකම් (පාලන) ගේ අත්සනින් යුතුව 2020.09.29 දින ලිපියක් අධ්‍යක්ෂ ජනරාල් මධ්‍යම | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම හා බැහැර කිරීම පිළිබඳ ගිණුම් තැබීම විධිමත්ව සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අධිකාරිය සතුව නොමැති බව එම අධිකාරියෙන් ලබා ගත් තොරතුරු අනුව තහවුරු විය. ඒ අනුව ඉහත වාහන 03 (අත්ට්‍රැක්ටර්) සම්බන්ධයෙන් භෞතික පැවැත්ම විගණනයට තහවුරු නොවුණි. | පරිසර අධිකාරියට යොමු කර ඇත. අත්ට්‍රැක්ටර් 03 හි ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත අප සතුව පවතින අතර මේ පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියෙන් සොයා බලමින් පවතී. | |
| (ග) | භෞතික තොග විගණන පරීක්ෂණ අවස්ථාවේදී අමාත්‍යාංශයේ ගබඩා පරිශ්‍රය තුළ අයිතමයන් 30 ක් (ටෝනර්, මවුස් පෑඩ් සහ තීන්ත) තොග පොත් වල ඇතුළත් කර නොතිබුණු අතර එම අයිතමයන් වර්තමානයේදී භාවිතා නොකරන බව අනාවරණය විය. එම අයිතමයන් භාවිතයට ගැනීමේ හැකියාව පරීක්ෂා කර බලා ඒ අනුව එම අයිතමයන් උපයෝජනය කිරීමට හෝ බැහැර කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | තොග පොත් වල නොමැති බවට සඳහන් අයිතමයන් මෑත කාලයේදී මිලදී ගන්නා ලද අයිතමයන් නොවන අතර මෙම අයිතමයන් ගබඩාවට ලැබුනේ කෙසේද යන්න ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන්ට අවබෝධයක් නොමැති අතර එ් පිළිබඳව ලේඛණද සොයා ගැනීමට නොහැකිව ඇත. ගබඩාවේ ප්‍රමාණවත් තරම් ඉඩකඩ නොපවතින බැවින් මෙම භාණ්ඩ පිළිබඳව නිසි අවධානයක් යොමු වී නොමැත. මෙම අයිතම ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනීමේ ඇති හැකියාවක් තිබේද යන්න සොයා බලා අවශ්‍ය කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | තොග පාලන පද්ධතීන් විදිමත් කල යුතුය. |

## 3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | රජයේ නිලධාරීන්ගේ ඇප තැබීමේ අවශ්‍යතාවය හා ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙල මුදල් රෙගුලාසි 880 සිට මුදල් රෙගුලාසි 893 දක්වා | මුදල් රෙගුලාසි 89 (I) පරිදි නිලධාරීන්ගෙන් ඇප අයකළ යුතුබව සඳහන් වුවද, ඇප අයකළ යුතු සරප්, ගබඩා භාරකරු වැනි ඇතැම් තනතුරු දරන නිලධාරීන්ට පැවරී ඇති | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| විධිවිධාන වල සඳහන් වන අතර රාජකාරි කටයුතු සඳහා ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන් රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරියට අනුව සිදු කල යුතු වේ. එසේම රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරියේ (4) වගන්තියට අනුව රජයේ නිලධාරීන් විසින් ඇප තැබිය යුතු ප්‍රමාණය හා ඇප තැබිය යුතු ක්‍රමය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට සිදු කළ හැකි වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | වගකීම අනුව එම තනතුරු වල රාජකාරී පැවැරීම ව ඉතා අපහසු වී ඇත. එකම සේවාවකට අයත් වන නිලධාරින් වගකීම වැඩි රාජකාරී සඳහා යෙදවීම අපහසු වී ඇත්තේ එම සේවාවේ ම අනෙකුත් තනතුරු වල ඇති වගකීම සාපේක්ෂව අඩු බැවිනි. එබැවින් මෙම වගකීම වැඩි තනතුරු සඳහා නිලධාරීන් යෙදවීම අපහසු වී තිබිය දී එම නිලධාරීන්ගෙන්ම ඇප අයකර ගැනීම ප්‍රායෝගිකව ගැටළු සහගත වි ඇත. | |

## 3.6 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | **PF-**9453 දරන කැබ් රථයට සිදුව තිබූ අනතුරක් සම්බන්ධයෙන් සිදු කල අළුත්වැඩියාවක් සඳහා රු. 53,200 ක් වැය වී තිබුණ ද අදාල මුදල රක්ෂණ සමාගම විසින් ප්‍රතිපූර්ණය කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. මේ අනුව එම වියදම පාඩු හා හානි ලෙස හඳුනා ගෙන සුදුසු පියවර ගෙන නොතිබුණි. | **PF** 9453 දරන කැබ් රථයේ අනතුර සම්බන්ධව සිදුවූ අලාභය රක්ෂණ ඔප්පුවෙන් ආවරණය නොවන බව රක්ෂණ සමාගම දන්වා ඇති හෙයින් පාඩු හා හානි ලේඛනයේ සටහන් කිරීමට පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. | ගණුදෙනු හා සිද්ධීන් හඳුනාගෙන නසි පරිදි ගිණුම් තැබිය යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ ජේෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව 21 ක් වූ අතර එය මුළු පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට 45 ක් ලෙස නිරූපණය විය. | ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ,ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය **MISCO** දත්ත පද්ධතිය හරහා හා ලිඛිතව වරින් වර දැනුවත් කිරීම් කර ඇත.ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ 1 ශ්‍රේණියේ තනතුරට නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2022 අනුව තනතුර සම්පූර්ණ කිරීමට ලිපි ඉදිරිපත් කර ඇත. අධ්‍යක්ෂ (ජෛව විවිධත්ව) තනතුරටද 2/2022 අනුව බඳවා ගැනීමට ලිපි ඉදිරිපත් කර ඇත.අනුමත කර ඇති කෘෂිකර්ම සේවයේ තනතුරු හා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 1 ශ්‍රේණියට අනුමත කර ඇති තනතුර පරිසර අමාත්‍යාංශයේ පෙර කාර්ය මණ්ඩලයේ නොතිබූ බැවින්ද එම තනතුරුවල අවශ්‍යතාවයක් දැනට පැන නොනඟින බැවින් ද එම අනුමැතිය සංශෝධනය කර දෙන ලෙස ඉල්ලා ඇත. | කළමනාකරණ කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදු කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය සඳහා අවශ්‍යතාවයක් නොමැති ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ **I , II** හා **III** ශ්‍රේණි සඳහා අනුමත තනතුරු 05 ක් අමාත්‍යාංශ කාර්යමණ්ඩල | මගේ අංක 02/02/**ADM/**විවිධ-10 හා 2020.09.10 දිනැති ලිපිය මගින් එම තනතුරු පෙර කාර්යය මණ්ඩලය තුළ නොතිබූ බැවින් එම තනතුරු | කළමනාකරණ කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදු කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තනතුරු ලෙස අනුමත කරවාගෙන තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට එම තනතුරු 05 ම පුරප්පාඩුව පැවතුණි. | 05 සඳහා ලබා දී ඇති අනුමැතිය සංශෝධනය කරන මෙන් ඉල්ලා ඇත. මෙම | |
| (ඇ) | පරිසර අමාත්‍යාංශය සඳහා අනුමත සංවර්ධන නිලධාරි තනතුරු වලට අමතරව සංවර්ධන නිලධාරීන් 294 ක් අමාත්‍යාංශයට අනුයුක්ත කර ඇතත් 2023 මැයි 30 දින වන විටත් ඒ සඳහා කාර්යමණ්ඩල තනතුරු අනුමත කරගෙන නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක **DMS/CM/**11 හා 2023.01.25 දිනැති ලිපියෙන් සංවර්ධන නිලධාරීන් 299 ක් සඳහා මෙම අමාත්‍යාංශයට අනුමැතිය ලැබී ඇත. | අවශ්‍යතාව අනුව අනුමත කාර්යමණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2020 සහ 2021 වර්ෂය තුලදී මෙන්ම සමාලෝචිත වර්ෂය තුලදීද කාර්මික නිලධාරි (විදුලි) කාර්මික නිලධාරි(ජල හා ගොඩනැගිලි) යන අනුමත තනතුරු දෙකද පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය. | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දන්වා ඇත්තේ කාර්මික නිලධාරි තනතුරුවල ඇති වී ඇති පුරප්පාඩු සඳහා විවෘත ධාරාව යටතේ බඳවා ගැනීම සඳහා පොදු තරඟ විභාගයක් පැවැත්වීමට තීරණය කර ඇති බවය.ඒ අනුව මෙම අමාත්‍යාංශයේ පවත්නා පුරප්පාඩු විස්තර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දී ඇත. | කළමනාකරණ කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදු කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |